සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

12649

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2000 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப்பத்திர(உயர் தர)ப் பரீட்சை, 2000 ஆகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2000

| කෘෂි විද්‍යාව I<br>விவசாய விஞ்ஞானம் I<br>**Agricultural Science I** | 08<br>S I |
|---|---|

පැ. දෙකයි / இரண்டு மணித்தியாலம் / Two hours

වැදගත් : **මේ ප්‍රශ්න පත්‍රය කවදසි දෙකකින් යුක්ත වේ.**
**පිළිතුරු සැපයීමට පෙර ඒවා පිටු අංක අනුව පිළියෙල කර ගන්න.**

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
(ii) උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
(iii) එම උත්තර පත්‍රයේ පිටුපස දී ඇති උපදෙස් පරෙස්සමෙන් කියවන්න.
(iv) 1 සිට 60 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) පිළිතුරුවලින් **නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගෙන එය **උත්තර පත්‍රයේ දක්වෙන උපදෙස් පරිදි** ලකුණු කරන්න.

---

1. ප්‍රාථමික පස් අංශු, ද්විතියික අංශු බවට සකස් වීම
   (1) පාංශු රූපාකාරය ලෙස හැඳින්වේ.
   (2) පාංශු වයනය ලෙස හැඳින්වේ.
   (3) පාංශු ව්‍යුහය ලෙස හැඳින්වේ.
   (4) අංශු ඝනත්වය ලෙස හැඳින්වේ.
   (5) දෘශ්‍ය ඝනත්වය ලෙස හැඳින්වේ.

2. වායුගෝලීය වාතයට සාපේක්ෂව, පාංශු වාතයේ සාමාන්‍යයෙන්
   (1) $CO_2$, $O_2$ හා සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු ය.
   (2) $CO_2$, $O_2$ හා සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි ය.
   (3) $CO_2$ හා සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු අතර, $O_2$ වැඩි ය.
   (4) $CO_2$ හා සාපේක්ෂ ආර්ද්‍රතාව වැඩි අතර, $O_2$ අඩු ය.
   (5) $CO_2$ වැඩි අතර, $O_2$ හා සාපේක්ෂ ආර්ද්‍රතාව අඩු ය.

3. ආග්නේය පාෂාණ යනු
   (1) ප්‍රාථමික පාෂාණ ජීරණය, ප්‍රවාහනය හා නැවත තැන්පත් වීමේ ප්‍රතිඵලයකි.
   (2) අධික පීඩනය හා උෂ්ණත්වයට භාජනය වූ අවසාදිත පාෂාණවලින් සෑදුන දෙයකි.
   (3) පෘථිවි පෘෂ්ඨය සිසිල් වීමෙන් සෑදුන දෙයකි.
   (4) බර මැටි තැන්පතු අධික පීඩනයකට භාජනය වී තද වීමෙන් සෑදුන දෙයකි.
   (5) හුනුගල් අධික උෂ්ණත්වයට භාජනය වීමෙන් සෑදුන දෙයකි.

● පහත රූ සටහන මගින් පාංශු ජලය වර්ගීකරණයක් දක්වෙන අතර අංක **4** හා **5** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙය භාවිත කරන්න.




4. ඉහත රූප සටහන අනුව "ශාකයට ලබාගත හැකි ජලය" දක්වෙන කලාපය වනුයේ
   (1) A ය. (2) B ය. (3) C ය. (4) D ය. (5) C හා D ය.

5. ඉහත රූප සටහන අනුව E කලාපයෙන් දක්වෙනුයේ
   (1) ලබාගත නොහැකි ජලය යි.
   (2) කේශික ජලය යි.
   (3) ගුරුත්වාකර්ෂණ ජලය යි.
   (4) පාංශු තෙතමන ප්‍රමාණය යි.
   (5) ජලය රඳ සිටීමේ ධාරිතාව යි.

[ අනෙක් පිට බලන්න.

6. පරාගණය යනු
   (1) පරාගධානියේ සිදුවන ඌනන විභාජනය වේ.
   (2) කලංකය මත පරාග කණිකා තැන්පත් වීම වේ.
   (3) කලංකය මත පරාග කණිකා ප්‍රරෝහණය වීම වේ.
   (4) පුං න්‍යෂ්ටිය මගින් ඩිම්බය සංසේචනය වීම වේ.
   (5) සංසේචිත ඩිම්බය, කලලයක් බවට වර්ධනය වීම වේ.

7. අතු බැඳීමේ දී
   (1) මුල් ඇදීම බලාපොරොත්තු වන ස්ථානයට ඉහළින් පොත්ත ඉවත් කළ යුතු ය.
   (2) පොත්ත ඉවත් නොකළ යුතු නමුත් අත්තෙහි ඇති පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතු ය.
   (3) මුල් ඇදීම බලාපොරොත්තු වන ස්ථානයට පහළින් පොත්ත ඉවත් කළ යුතු ය.
   (4) පොත්ත හා අත්තෙහි පත්‍රවලින් අඩක් ඉවත් කළ යුතු ය.
   (5) අත්තෙහි ඇති පත්‍ර සියල්ල ඉවත් කළ යුතු ය.

8. පසක අත්‍යවශ්‍ය මූලද්‍රව්‍ය වලින් වැඩි හරියක් ලබාගත හැකි ආකාරයේ පවතින pH පරාසය වනුයේ
   (1) 4.5 ට අඩු අගයන් ය.
   (2) 4.5 හා 6.5 අතර ය.
   (3) 8.0 ට වැඩි අගයන් ය.
   (4) 7.0 හා 8.0 අතර ය.
   (5) 6.5 හා 7.0 අතර ය.

9. එක්තරා ශාකයක වර්ණය මලානික කොළ පැහැයට හැරිණි. ඉන්පසු පරිණත පත්‍ර කහ විය. වර්ධනය බාල විය. ඉහත ලක්ෂණවලට අනුව මෙම ශාකය
   (1) N ඌණතාවය පෙන්වයි.
   (2) Mg ඌණතාවය පෙන්වයි.
   (3) K ඌණතාවය පෙන්වයි.
   (4) B ඌණතාවය පෙන්වයි.
   (5) Mn ඌණතාවය පෙන්වයි.

10. කෘමීන් හා මයිටාවන් අතර ප්‍රධාන වෙනස්කම වනුයේ
   (1) කෘමීන්ට බාහිර සැකිල්ලක් තිබෙන නමුත් මයිටාවන්ට බාහිර සැකිල්ලක් නැත.
   (2) කෘමීන්ට ඛණ්ඩවලට බෙදුන පාද ඇති නමුත් මයිටාවන්ට ඛණ්ඩවලට බෙදුන පාද නැත.
   (3) කෘමීන් හැව හරින නමුත්, මයිටාවන් හැව හරින්නේ නැත.
   (4) කෘමීන්ට ස්පර්ශක ඇති නමුත් මයිටාවන්ට ස්පර්ශක නැත.
   (5) කෘමීන්ගේ ශරීරය කොටස් දෙකකට බෙදී ඇති නමුත් මයිටාවන්ගේ ශරීරය කොටස් තුනකට බෙදී ඇත.

11. එක්තරා ශාක පටකයක ප්‍රාදේශීය ලප කිහිපයක් නිරීක්ෂණය කරන ලදී. මෙම ලප මැරුණු පටක වූ අතර කහ පැහැයට හුරු කොළ පැහැති දරයකින් වට වී තිබිණි. ඉහත ලක්ෂණවලට අනුව මෙය
   (1) දිලීර ආසාදනයකි.
   (2) බැක්ටීරියා ආසාදනයකි.
   (3) වයිරස් ආසාදනයකි.
   (4) නෙමටෝඩා ආසාදනයකි.
   (5) කායික විද්‍යාත්මක අක්‍රමිකතාවයකි.

12. වල් පැළෑටි පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
   (A) වාර්ෂික වල් පැළ වසරක් තුළ දී බීජ නිපදවයි.
   (B) ද්විවාර්ෂික වල් පැළ දෙවන වසරේ දී බීජ නිපදවයි.
   (C) බහුවාර්ෂික වල් පැළ පරිණත වීමෙන් පසු එක් වරක් පමණක් බීජ නිපදවන නමුත් වසර දෙකකට වඩා කාලයක් ජීවත් වේ.

   ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශ / ප්‍රකාශය වනුයේ
   (1) A පමණි.
   (2) B පමණි.
   (3) C පමණි.
   (4) A හා B පමණි.
   (5) A හා C පමණි.

13. උස ශාකයක ජල අවශෝෂණය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ
   (1) මූල පීඩනය මගිනි.
   (2) නිපාතය මගිනි.
   (3) උත්ස්වේදන වූෂණය මගිනි.
   (4) කේශික ක්‍රියාව මගිනි.
   (5) වායුගෝලීය පීඩනය මගිනි.

14. 2, 4 – D යනු
(1) වල්නාශකයක් වන නමුත් වර්ධක යාමකයක් නොවේ.
(2) වල්නාශකයක් මෙන් ම වර්ධක යාමකයක් ද වේ.
(3) කෘමිනාශකයක් වන නමුත් වර්ධක යාමකයක් නොවේ.
(4) කෘමිනාශකයක් මෙන්ම වර්ධක යාමකයක් ද වේ.
(5) ඉහත කිසිවක් නොවේ.

15. සාපේක්ෂ ආර්ද්‍රතාවය මැනීමට භාවිත කරන උපකරණය වනුයේ
(1) වාෂ්පීකරණ තැටිය යි.
(2) තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය යි.
(3) ආනතිමානය යි.
(4) pH මීටරය යි.
(5) බැරෝ මීටරය යි.

16. දිගු දින ශාක
(1) මල් හටගන්නේ දිවා දිග, අවධි දිවා දිගට වඩා දීර්ඝ වූ විට ය.
(2) මල් හටගන්නේ දිවා දිග, අවධි දිවා දිගට වඩා කෙටි වූ විට ය.
(3) දිවා දිගෙහි බලපෑමට යටත් නොවේ.
(4) කෙටි දින ශාකවලට වඩා උසින් වැඩි ය.
(5) මල් පිපීමට වැඩි කාලයක් ගනී.

17. බිංදුමය ජල සම්පාදනය වඩාත් සුදුසු වන්නේ
(1) එළවළු බෝගය සඳහා ය.
(2) වී බෝගය සඳහා ය.
(3) මිරිස් බෝගය සඳහා ය.
(4) වැල් දෙඩම් බෝගය සඳහා ය.
(5) අඹ බෝගය සඳහා ය.

18. ධාන්‍ය ගබඩා කිරීමට වඩාත් සුදුසු තත්ත්ව වනුයේ
(1) අඩු වාතනය හා අඩු උෂ්ණත්වය වේ.
(2) අඩු වාතනය හා අඩු ආර්ද්‍රතාවය වේ.
(3) අඩු ආලෝක තීව්‍රතාවය හා අඩු උෂ්ණත්වය වේ.
(4) අඩු ආලෝක තීව්‍රතාවය හා අඩු ආර්ද්‍රතාවය වේ.
(5) අඩු උෂ්ණත්වය හා අඩු ආර්ද්‍රතාවය වේ.

19. ගබඩා කිරීමේ දී වීවල තෙතමන ප්‍රමාණය
(1) 16% වඩා අඩු විය යුතු ය.
(2) 14% වඩා අඩු විය යුතු ය.
(3) 12% වඩා අඩු විය යුතු ය.
(4) 10% වඩා අඩු විය යුතු ය.
(5) 8% වඩා අඩු විය යුතු ය.

20. පහත දී ඇති ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ
(1) බීජ සුප්තතාව, නව ප්‍රභේදවල බහුල ය.
(2) බීජ සුප්තතාව, සෑම විටක ම කෘෂිකාර්මික කටයුතුවලට බාධකයකි.
(3) බීජ සුප්තතාව යනු විශාල ක්ෂේත්‍රයක පැතිරීම සඳහා ශාක දක්වන අනුවර්තනයකි.
(4) සුප්ත බීජ ජීව්‍යතාවයෙන් තොර ය.
(5) සුප්ත බීජ මනුෂ්‍ය පරිභෝජනයට සුදුසු නැත.

21. ශාකවල පැවැත්ම සඳහා බීජ වැදගත් වනුයේ
(1) එමගින් ශාක ගුණනය විය හැකි නිසා ය.
(2) ඒවායේ ඇති අහිතකර තත්ත්ව මග හැරීමේ හැකියාව නිසා ය.
(3) ඒවායේ ඇති ව්‍යාප්ති වීමේ හැකියාව නිසා ය.
(4) ඉහත 1, 2 හා 3 නිසා ය.
(5) බීජාවරණය නිසා ය.

22. පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිරවද්‍ය ප්‍රකාශය වනුයේ
(1) මස් සංරක්ෂණය කිරීමේ වඩාත් ජනප්‍රිය ම ක්‍රමය වනුයේ වියළීමයි.
(2) පැස්ටරීකරණය මගින් කිරිවල අඩංගු බොහොමයක් පෝෂක විනාශ කරයි.
(3) අධිශීතකරණය කරන ලද කුකුල් මස් දිගු කාලයක් ගබඩා කර තැබිය හැක.
(4) එළවලු සංරක්ෂණය කිරීමේ වියදම් අධිකම ක්‍රමය වනුයේ වියළීමයි.
(5) අධිශීතකරණය මගින් ආහාරවල පෝෂ්‍ය අගය ඉතා විශාල ලෙස පහළ හෙළයි.

[ අනෙක් පිට බලන්න.

23. මනුෂ්‍යයන්ගේ ආහාර වේලට පලතුරුවලින් ප්‍රධාන වශයෙන් ලැබෙනුයේ
(1) විටමින්, කාබෝහයිඩ්‍රේට සහ ඛනිජ ය. (2) විටමින්, ජලය සහ මේදය ය.
(3) විටමින්, ප්‍රෝටීන් සහ මේදය ය. (4) ජලය, ප්‍රෝටීන් සහ ඛනිජ ය.
(5) ජලය, කාබෝහයිඩ්‍රේට සහ මේදය ය.

24. ආහාර දූෂණය වීමට බහුල ලෙස දායක වන ක්ෂුද්‍රජීවීන් වනුයේ
(1) වයිරස් සහ බැක්ටීරියා ය. (2) බැක්ටීරියා සහ ප්‍රොටොසෝවා ය.
(3) දිලීර සහ ප්‍රොටොසෝවා ය. (4) බැක්ටීරියා සහ දිලීර ය.
(5) කෘමීන් සහ දිලීර ය.

25. ප්‍රතිඔක්සිකාරකයක් ආහාරවලට එකතු කරනුයේ
(1) ජලය සහ විටමින් නැතිවීම වළක්වා ගැනීමට ය.
(2) විටමින් සහ එන්සයිම නැතිවීම වළක්වා ගැනීමට ය.
(3) මුඩුවීම සහ දුර්වර්ණ වීම වළක්වා ගැනීමට ය.
(4) මුඩුවීම සහ එන්සයිමවල ක්‍රියාකාරිත්වය අඩුවීම වළක්වා ගැනීමට ය.
(5) දුර්වර්ණවීම සහ එන්සයිමවල ක්‍රියාකාරිත්වය වළක්වා ගැනීමට ය.

26. වටනය
(1) යනු කුකුළාගේ ආහාර එන්සයිම මගින් ජීරණය වන ස්ථානය වේ.
(2) යනු කුකුළාගේ ආහාර යාන්ත්‍රික ව ජීරණය වන ස්ථානය වේ.
(3) යනු ගවයාගේ ආහාර යාන්ත්‍රික ව ජීරණය වන ස්ථානය වේ.
(4) මී වදයක් වැනි පෙනුමක් සහිතය.
(5) යනු කුකුළාගේ ආහාර ගබඩා කරන ස්ථානය වේ.

27. ඩිම්බ මෝචනය සඳහා බලපාන හෝර්මෝනය වනුයේ
(1) ඊස්ට්‍රජන් ය.
(2) ප්‍රෝජෙස්ටෙරොන් ය.
(3) ලූටෙයිනීකරණ හෝර්මෝනය (LH) ය.
(4) ස්‍යූනිකා උත්තේජක හෝර්මෝනය ය.
(5) ටෙස්ටොස්ටෙරොන් ය.

28. බිත්තර සුදු මදය ස්‍රාවය වීම සිදුවන්නේ
(1) ග්‍රීවිකාව (කෘකාටය) පෙදෙසෙහි ය.
(2) කාහලිකාවෙහි (නිවාපය) ය.
(3) මැග්නමය (මහාජිද්‍රය) පෙදෙසෙහි ය.
(4) ඩිම්බකෝෂයෙහි ය.
(5) ගර්භාශයෙහි ය.

29. කුකුළන්ට කොක්සිඩියෝසිස් සෑදෙන්නේ
(1) වයිරස් මගිනි. (2) බැක්ටීරියා මගිනි.
(3) ප්‍රොටොසෝවා මගිනි. (4) දිලීර මගිනි.
(5) ඉහත කිසිවකින් නොවේ.

30. මී කිරිවල අඩංගු සාමාන්‍ය මේද ප්‍රමාණය වනුයේ
(1) 6% කි. (2) 8% කි. (3) 10% කි. (4) 12% කි. (5) 14% කි.

31. බිත්තර කහ මදයේ කහ වර්ණයට හේතුව
(1) සැන්තොෆිල් අඩංගු වීම ය.
(2) විටමින් A අඩංගු වීම ය.
(3) මයෝග්ලෝබින් අඩංගු වීම ය.
(4) විටමින් B සංකීර්ණය අඩංගු වීම ය.
(5) සල්ෆර් අඩංගු වීම ය.

32. සාන්ද්‍ර ආහාරවල අඩංගු දළ තන්තු ප්‍රමාණය
(1) 12% ට වඩා අඩුවිය යුතු ය. (2) 14% ට වඩා අඩුවිය යුතු ය.
(3) 16% ට වඩා අඩුවිය යුතු ය. (4) 18% ට වඩා අඩුවිය යුතු ය.
(5) 20% ට වඩා අඩුවිය යුතු ය.

33. කුකුල් බිත්තරයක බීජෞෂණ (රක්කවීමේ) කාලය

(1) දින 30 කි.
(2) දින 28 කි.
(3) දින 21 කි.
(4) දින 14 කි.
(5) ඉහත කිසිවක් නොවේ.

34. එරියක ගේ මද කාලය

(1) පැය 24 කට අඩු ය.
(2) දින 1 - 2 කි.
(3) දින 2 - 3 කි.
(4) දින 4 - 5 කි.
(5) දින 5 - 6 කි.

35. බීජ ජීවානුහරණය

(A) බීජ ප්‍රතිකාරකයක් ලෙස සැලකේ.
(B) බීජ මගින් පැතිරෙන රෝග හා පළිබෝධ වැළැක්වීම සඳහා සිදු කරනු ලැබේ.
(C) ප්‍රරෝහණයේ මුල් අවස්ථාවල දී පෝෂක ලබාදීම සඳහා සිදු කරනු ලැබේ.
(D) අඩෝහෙම ප්‍රරෝහණයක් සහිත බීජ සඳහා පමණක් සිදු කරනු ලැබේ.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A හා D පමණි.
(4) B හා C පමණි.
(5) B හා D පමණි.

36. බීජ ගබඩා තුළට කෘමි පළිබෝධයන් ඇතුළු විය හැක්කේ

(A) උපකරණ මගිනි.
(B) සේවකයන් මගිනි.
(C) පැරණි ඇසුරුම් ද්‍රව්‍ය මගිනි.
(D) සුළඟ මගිනි.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ

(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා C පමණි.
(4) B හා D පමණි.
(5) C හා D පමණි.

37. බීජ සහතික කිරීමේ දී සලකනු ලබන ප්‍රධාන සාධක වනුයේ

(1) ප්‍රරෝහණ ප්‍රතිශතය, බීජ දහසක බර හා පිරිසිදු බව වේ.
(2) ප්‍රරෝහණ ප්‍රතිශතය, තෙතමන ප්‍රතිශතය හා බීජ වර්ණය වේ.
(3) තෙතමන ප්‍රතිශතය, පිරිසිදු බව හා බීජ දහසක බර වේ.
(4) පිරිසිදු බව, බීජ වර්ණය හා තෙතමන ප්‍රතිශතය වේ.
(5) තෙතමන ප්‍රතිශතය, ප්‍රරෝහණ ප්‍රතිශතය හා පිරිසිදු බව වේ.

38. පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වනුයේ

(1) ක්ෂුද්‍ර ප්‍රචාරණය, අනෙකුත් බහුල ප්‍රචාරණ ක්‍රමවලට වඩා වියදම් අඩු ක්‍රමයකි.
(2) ක්ෂුද්‍ර ප්‍රචාරණයේ දී දෛහික ක්ලෝන විචලතාවය ඇති වේ.
(3) ක්ෂුද්‍ර ප්‍රචාරණය, පලතුරු බෝග ගුණනය කිරීම සඳහා වඩාත් සුදුසු වේ.
(4) ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා ශ්‍රමය විශාල වශයෙන් අවශ්‍ය වේ.
(5) ක්ෂුද්‍ර ප්‍රචාරණය මගින් රෝගවලින් තොර ශාක ලබාගත හැක.

39. කාබනික ද්‍රව්‍ය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.

(A) මිනැම ජීරණය වූ කාබනික ද්‍රව්‍යයක් කොම්පෝස්ට් ලෙස සැලකිය හැකි ය.
(B) C/N අනුපාතය හා pH අගය සකස් කිරීම සඳහා කොම්පෝස්ට් ගොඩට ආරම්භක මිශ්‍රණය ඇතුල් කරනු ලැබේ.
(C) C/N අනුපාතය අධික ද්‍රව්‍ය ජීරණය කිරීමට පහසු ය.

ඉහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශ/ප්‍රකාශය වනුයේ

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) A හා C පමණි.

40. ෆ්ලොරිජින් (Florigen) යනු

(1) ඵල හට ගැනීමට අදාළ හෝර්මෝනයකි.
(2) මල් හට ගැනීමට අදාළ හෝර්මෝනයකි.
(3) ඵල හට ගැනීමට අදාළ වර්ධක යාමකයකි.
(4) මල් හට ගැනීමට අදාළ වර්ධක යාමකයකි.
(5) දියර පොහොර වර්ගයක වෙළඳ නාමයකි.

41. අවම බිම් සැකැස්ම වඩාත් සුදුසු වනුයේ
(1) අපිභෞම ප්‍රරෝහණයක් සහිත බෝගවලට ය.
(2) අධෝභෞම ප්‍රරෝහණයක් සහිත බෝගවලට ය.
(3) කුඩා බීජ සහිත බෝගවලට ය.
(4) විශාල බීජ සහිත බෝගවලට ය.
(5) තද බීජාවරණයක් සහිත බෝගවලට ය.

42. පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ
(1) අවම බිම් සැකැස්ම මගින් පස් තදවීම වැඩි වේ.
(2) සම්ප්‍රදායික ලෙස බිම් සැකසූ පසකට වඩා වේගයෙන් ශූන්‍ය බිම් සැකසූ පසක් වියළේ.
(3) අවම බිම් සැකැස්ම හා ශූන්‍ය බිම් සැකැස්ම අතර වෙනසක් නැත.
(4) අවම බිම් සැකැස්මට යන වියදම අඩු බැවින්, ආන්තික ඉඩම් වගා කිරීමට ඉඩ ලැබේ.
(5) අවම බිම් සැකැස්මට සාපේක්ෂව සම්ප්‍රදායික බිම් සැකැස්ම සඳහා උපකරණ අවශ්‍යතාවය අඩු ය.

43. වාරි ජල සැපයුමක ප්‍රමාණය හා වාර ගණන ගණනය කිරීමේ දී සලකන ලද සාධක පහත දක්වේ.
(A) ශාක මුලෙහි ගැඹුර
(B) මුලේ ගැඹුර තුළ ඇති පසෙහි ජලය රඳ පවතින කාලය
(C) ශාකයේ පාරිභෝගික ජල භාවිතාව
(D) ලබාගතහැකි වාරි ජල ප්‍රමාණය

ඉහත සාධක අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A හා B පමණි.
(2) A, B හා C පමණි.
(3) A, B හා D පමණි.
(4) B, C හා D පමණි.
(5) A, B, C හා D යන සියල්ල ම.

44. පොලිතීන් ගෘහ (Poly-tunnels) තුළ ශාක කැබලිවල මුල් ඇදීම ප්‍රවර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වන්නේ
(1) අර්ධ සෙවන හා ඉහළ ආර්ද්‍රතාවය ය.
(2) අර්ධ සෙවන හා ඉහළ උෂ්ණත්වය ය.
(3) ඉහළ ආර්ද්‍රතාවය හා ඉහළ උෂ්ණත්වය ය.
(4) පළිබෝධ හා සුළඟින් ආරක්ෂා වීම ය.
(5) පළිබෝධ හා රෝගවලින් ආරක්ෂා වීම ය.

45. වර්තමානයේ ශ්‍රී ලංකාවේ වඩාත් බහුල ව භාවිත වන ප්‍රචාරක ව්‍යුහය වනුයේ
(1) ලැත් නිවාස
(2) හරිතාගාර
(3) පොලිතීන් ගෘහ (Poly-tunnels)
(4) උඩවැඩියා නිවාස
(5) පොල්අතු නිවාස

46. SALT යනු
(1) බෑවුම් ඉඩම් සඳහා භාවිත වන බෝග වගා පද්ධතියකි.
(2) බෑවුම් ඉඩම්වල වගාකරන බෝගයකි.
(3) තැනිතලා භූමි සඳහා භාවිත වන බෝග වගා පද්ධතියකි.
(4) තැනිතලා ඉඩම්වල වගා කරන බෝගයකි.
(5) ලවණ බිම්වලට අනුවර්තනය වූ බෝගයකි.

47. කෘෂි වන වගා පද්ධතියකට උදාහරණයක් වනුයේ
(1) සෙවන ශාක සහිත තේ වගාවක්.
(2) පහතරට එළවලු වගාවක්.
(3) උඩරට එළවලු වගාවක්.
(4) රබර් වගාවක්.
(5) සම්ප්‍රදායික උඩරට ගෙවතු වගාවක් (Kandyan home garden)

48. පහත දක්වෙනුයේ පාෂාණ හා ඛනිජ පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
(A) පාෂාණ යනු ඛනිජ එකක් හෝ එකකට වඩා අඩංගු ඝන ස්කන්ධ වේ.
(B) ඛනිජ යනු නිශ්චිත සංයුතියක් සහිත අකාබනික සමජාතීය ද්‍රව්‍ය වේ.
(C) ඛනිජවලට නිශ්චිත හැඩයක්, වර්ණයක් හා ද්‍රවාංකයක් නැත.

ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) B හා C පමණි.
(4) A පමණි.
(5) B පමණි.

49. බෝර්ඩෝ (Bordeaux) මිශ්‍රණය යනු
(1) පටක රෝපණ මාධ්‍යයකි.
(2) පොහොර මිශ්‍රණයකි.
(3) දිලීරනාශකයකි.
(4) කෘමිනාශකයකි.
(5) පාංශු ආකලනයකි.

50. පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි ප්‍රකාශය වනුයේ
(1) රතු ආලෝකය කෙටි දින ශාකවල පුෂ්පීකරණය නිශේධනය කරයි.
(2) රතු ආලෝකය කෙටි දින ශාකවල පුෂ්පීකරණය ප්‍රේරණය කරයි.
(3) රතු ආලෝකය කෙටි දින ශාකවල පුෂ්පීකරණය කෙරෙහි බලපෑමක් නො කරයි.
(4) රතු ආලෝකය දිගු දින ශාකවල පුෂ්පීකරණය කෙරහි බලපෑමක් නො කරයි.
(5) රතු ආලෝකය සියලු ම ශාකවල පුෂ්පීකරණය නිශේධනය කරයි.

51. පහත දක්වෙනුයේ බහුගුණ පිළිබඳ ප්‍රකාශ කිහිපයකි.
(A) බහුගුණවල වර්ණ දේහ 2n වලට වඩා පිහිටා ඇත.
(B) බහුගුණ, බීජ සාදනු නො ලැබේ.
(C) කොල්චිසීන් මගින් බහුගුණතාවය ඇති කරනු ලැබේ.
(D) බහුගුණවල කෘෂිකාර්මික වැදගත්කමක් නැත.
ඉහත ප්‍රකාශ අතුරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A හා D පමණි.
(4) B හා C පමණි.
(5) B හා D පමණි.

52. අනුපූරක සාධක ප්‍රවේණියෙහි $F_2$ පරම්පරාවෙහි රූපානුදර්ශ අනුපාතය වනුයේ
(1) 9 : 7
(2) 15 : 1
(3) 13 : 3
(4) 9 : 6 : 1
(5) 12 : 3 : 1

53. එක්තරා ප්‍රදේශයක වගාකර ඇති බෝංචි බෝගයක දෛනික වාෂ්පීකරණ උත්ස්වේදනය 2·00 mm වේ. එම ප්‍රදේශයේ හෙක්ටාර එකක (1) බෝංචි වගාවකට දිනපතා යෙදිය යුතු අවම ජල පරිමාව වනුයේ
(1) $0{\cdot}02\ m^3$
(2) $0{\cdot}20\ m^3$
(3) $2{\cdot}00\ m^3$
(4) $20{\cdot}00\ m^3$
(5) $200{\cdot}00\ m^3$

54. වැස්සක දී 10 cm විෂ්කම්භයෙන් යුත් වර්ෂාමානයකට එකතු වූ ජල පරිමාව $550\ cm^3$ නම් එම වර්ෂාපතනය, සමාන වනුයේ
(1) 7·0 cm ය.
(2) 5·0 cm ය
(3) 25·0 cm ය.
(4) 22·0 cm ය.
(5) 10·0 cm ය.

- අංක **55** හා **56** ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා පහත රූ සටහන භාවිත කරන්න.




55. ව්‍යාප්තියේ මාතය (mode) වනුයේ
(1) A ය.
(2) B ය.
(3) C ය.
(4) D ය.
(5) E ය.

56. ඉහත ව්‍යාප්තියේ පරාසය වනුයේ
(1) B – A අතර වෙනස ය.
(2) C – A අතර වෙනස ය.
(3) D – A අතර වෙනස ය.
(4) E – A අතර වෙනස ය
(5) D – B අතර වෙනස ය.

[ අනෙක් පිට බලන්න.

57. පහත දක්වෙන දිස්ත්‍රික්ක අතුරෙන් වැඩිම ජනගහනයක් ඇති දිස්ත්‍රික්ක මොනවා ද?
(1) කොළඹ, ගම්පහ, කුරුණෑගල.
(2) ගාල්ල, කොළඹ, කුරුණෑගල.
(3) කොළඹ, ගාල්ල, නුවර.
(4) රත්නපුර, කුරුණෑගල, කොළඹ.
(5) කොළඹ, ගාල්ල, ගම්පහ.

58. අපනයන දශකය ලෙස හඳුන්වනු ලබන්නේ
(1) 1992 - 2002
(2) 1990 - 2000
(3) 1995 - 2005
(4) 1998 - 2008
(5) 1991 - 2001

59. "නිෂ්පාදන ප්‍රමාණය × ඒකක මිල" මගින් ලැබෙනුයේ
(1) ආන්තික ආදයම
(2) මුළු ආදයම
(3) සාමාන්‍ය ආදයම
(4) මුළු ලාභය
(5) සාමාන්‍ය ලාභය

60.




ඉහත රූප සටහනෙහි A, B හා C වක්‍ර මගින් නියෝජනය වනුයේ පිළිවෙළින්
(1) මුළු නිෂ්පාදිතය, මුළු විචල්‍ය වියදම, මුළු ස්ථාවර වියදම
(2) සාමාන්‍ය වියදම, සාමාන්‍ය විචල්‍ය වියදම, මුළු ස්ථාවර වියදම
(3) මුළු වියදම, මුළු විචල්‍ය වියදම, මුළු ස්ථාවර වියදම
(4) සාමාන්‍ය මුළු වියදම, ආන්තික වියදම, ස්ථාවර වියදම
(5) ඉහත කිසිවක් නොවේ.